# Abstract No 60

## දූත ගීතය කෙරෙහි මේඝදූතයේ බලපෑම

**චින්තා පවිත්‍රානි**
කනිෂ්ඨ අධිශිෂ්‍යත්වලාභී, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
chinthapawithrani@gmail.com

සංස්කෘත කවීන් අතර ශ්‍රේෂ්ඨතමයා ලෙස සැලකෙන කාලිදාසයන් විසින් රචනා කරන ලද මේඝ දූතය උසස් කාව්‍යයක් ලෙස විචාරක සම්භාවනාවට පාත්‍ර වූවකි. දෙස් විදෙස් නොයෙක් නිර්මාණකරුවන්ට එහි බලපෑම ලැබී ඇති බව ද ප්‍රකට කරුණකි. දර්ශන රත්නායකයන් විසින් රචිත විශිෂ්ට කාව්‍ය නිර්මාණයක් වන දූත ගීතයට මේඝ දූතයෙන් යම්බඳු ආභාසයක් ලැබී ඇති අයුරු විමර්ශනය මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි අරමුණ යි. මේ සඳහා මේඝ දූතය හා දූත ගීතය යන කාව්‍යයද්වය හා ඒ පිළිබඳ ලියැවුණු විචාර ග්‍රන්ථ පාදක කර ගැනේ. ආකෘතිය, වස්තු විෂය, කාව්‍යෝක්ති, ජීවන දෘෂ්ටිය යනාදි අංග අතින් දූත ගීතය ඇතැම් විට මේඝ දූතයේ ආභාසය විශද කරන ආකාරය පිළිබඳ මෙහි දී අවධානය යොමු කෙරේ. නිර්මාණකරණයේ දී සෘජු අනුකරණය බැහැර කළ හැකි වුව ද නිර්මාණාත්මක ලෙස යම් කෘතියක ආභාසය ලැබීම කිසිසේත් ම දෝෂයක් නොවේ. දූත ගීතය රචනයෙහිලා ඉවහල් කොටගෙන ඇත්තේ මේඝ දූතයේ එන මන්දාක්‍රාන්ත නම් විරිත යි. මේඝ දූතය මෙන් ම දූත ගීතය ද සන්දේශ ආකෘතියට අනුව රචනා වී ඇති අතර වියෝග දුක දනවන ප්‍රස්තුතයක් වස්තු විෂය කරගෙන ඇති බව පැහැදිලි ය. මේඝ දූතයෙහි පැනෙන අතිශය සෞන්දර්යාත්මක කාව්‍ය චින්තාවන්ට තරමක් දුරට සමාන කළ හැකි ඇතැම් කාව්‍යෝක්ති දූත ගීතයෙහි ද දක්නට ලැබේ. විශේෂයෙන් ම සකු කවි සමයෙහි පැනෙන නානාවිධ සංකල්පනා ස්වකීය නිර්මාණයට පාදක කරගැනීමට දර්ශන රත්නායක සමත් වේ. ඇතැම් සංකල්පනා ඒ ආකාරයෙන් ම උපයෝගී කරගැනීම, නිර්මාණාත්මක ලෙස ඇතැම් කාව්‍යෝක්තීන්හි මුල් ස්වභාවය අතික්‍රමණය කිරීම යනාදි ලක්ෂණ එහිලා වැදගත් වේ. වෙසෙසින් ම ලාංකේය සමාජ පසුබිම මත පිහිටා ප්‍රස්තුතය විකාසනය කිරීමත්, සෞන්දර්යාත්මක පදනම කෙරෙහි පමණක් සීමා නොවී සමාජ යථාර්ථය නිරූපණය කෙරෙහි දක්වන නැඹුරුවත් හේතුවෙන් දූත ගීතයේ අනන්‍යතාව පැහැදිලි ව හඳුනාගත හැකි ය. ජීවන දෘෂ්ටිය අතින් ද මේඝ දූතය හා දූත ගීතය අතර යම් සාම්‍යතාවක් නිරීක්ෂණය කළ හැකි ය. සමස්තයක් වශයෙන් ගත් කල දූත ගීතයේ පෝෂණ අවකාශය වඩාත් පුළුල් වපසරියක් ප්‍රදර්ශනය කරන බව පැහැදිලි වන අතර එහිලා මේඝ දූතයට ප්‍රමුඛතාවක් හිමිවන බව පැහැදිලි කරුණකි. මේ අයුරින් මේඝ දූතයෙන් දූත ගීතයට ලැබී ඇති බලපෑම සනිදර්ශනාත්මක ව විමර්ශනයට අවකාශ පවතී.

**ප්‍රමුඛ පද -** මේඝදූතය, දූතගීතය, සකුකවි සමය, ආභාසය, අනුකරණය